# උතුරු මැද පළාත් සභාව
# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
# අතිරේක පළාත් අධ්‍යක්ෂ
# තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.

උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා දැනට සේවයේ නියුතු , ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරීන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් පහත සඳහන් පරිදි වේ.

අ) අයදුම්කරු ශ්‍රී ලංකාව තුළ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ආ) පශු වෛද්‍ය විද්‍යා උපාධියක් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ වසර 03 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියෙකු වීම.

ඇ) අයදුම්කරු පසුගිය වසර 05 ක කාලය තුළ නියමිත වැටුප් වර්ධක උපයාගත් සතුටුදායක සේවා කාලයක් සහිත හා කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ නිලධාරියෙකු විය යුතුය.

ඈ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබාගත් නිලධාරියා තෝරා පත්කරගනු ලැබේ.

*සටහන : **බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.**

**අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රය තම අත් අකුරින් පැහැදිලිව සම්පූර්ණ කර, තම ආයතන ප්‍රධානියා මගින් "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු මැද පළාත,අනුරාධපුර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.01.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ යොමුකල යුතුය. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම් කිරීම - 2025 " යනුවෙන් සඳහන් කල යුතුය.**

**උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු මෙම තනතුර සඳහා තෝරාපත් කරගනු ලබන අතර, එසේ තෝරාපත් කර ගනු ලබන නිලධාරියා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන දිනකදී තම සේවා ස්ථානයෙන් වහාම නිදහස් වී, මෙම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත සේවයට වාර්තා කල යුතුය. එසේ කිරීමට ඔබ අපොහොසත් වුවහොත් එම අවස්ථාව කුසලතාවයේ ප්‍රමුඛතාව අනුව ඊළඟ සුදුස්සාට හිමිවනු ඇත.**

**මෙම පත්වීම සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට හා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පොදු විධිවිධානයන්ට යටත්ව බව අයදුම්කරුවන් සැළකිය යුතු වන අතර, බඳවා ගැනීම හෝ පත්කිරීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තිරණය වේ.**

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු මැද පළාත,**
**අනුරාධපුර.**
**2025.12.15**

**<u>උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය</u>**

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ලබාදෙන අනු ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **1. ජ්‍යෙෂ්ඨත්වය** | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ වසර 03 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඉතිරි වන අමතර සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබාදිය යුතු අතර, එම අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදීමේදී වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ප්‍රමාණය ද සෙසු නිලධාරීන්ට, සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදීම.<br>*(රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2019)* | **40** | **40** |
| **2. කුසලතාව** | **1. වෘත්තීය සුදුසුකම් (ක්ෂේත්‍රයට අදාලව)**<br>පශ්චාත් උපාධි - 08 (එකකට පමණක් ලකුණු පිරිනැමේ)<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 05 (එකකට පමණක් ලකුණු පිරිනැමේ)<br>සහතික පත්‍ර පාඨමාලා - 02 (එකකට පමණක් ලකුණු පිරිනැමේ)<br>(කාලසීමාව මාස 06 හෝ ඊට වැඩි විය යුතුය) | **15** | **60** |
| | 11. **කාර්යය සාධන ඇගැයුම් (පූර්වාසන්න වසර 05 තුළ)**<br>විශිෂ්ඨ මට්ටමේ කාර්යය සාධනය සඳහා වසරකට ලකුණු 03 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ මට්ටමේ කාර්යය සාධනය සඳහා වසරකට ලකුණු 02 බැගින්<br>සතුටුදායක මට්ටමේ කාර්යය සාධනය සඳහා වසරකට ලකුණු 01 බැගින් | **15** | |
| | **111. ක්ෂේත්‍රයේ ප්‍රගමනයට ලබාදී ඇති දායකත්වය/සංවිධාන ශක්තිය**<br>(i) පරිපාලනමය හෝ කළමනාකරණ මට්ටමේ තනතුරක ඇති පළපුරුද්ද<br>( වසරකට ලකුණු 01 බැගින් වසර 05 සඳහා )<br>(ii) ප්‍රශංසා - 05<br>(අදාල කාලසිමාව තුළ එක් ප්‍රශංසා ලිපියකට ලකුණු 01 බැගින්)<br>(iii) පළාත්/ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් පළ කර ඇති පර්යේෂණ නිබන්ධන/නව සොයාගැනීම් / ප්‍රකාශන - 05<br>(එක් නිබන්ධනයකට/නව සොයාගැනීමකට/ප්‍රකාශනයකට ලකුණු 01 බැගින්)<br>(iv) ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් - 05<br>(ගොවීන්ගේ අභිවෘද්ධිය සඳහා කළ විශේෂ වැඩසටහන් - එක් වැඩසටහනකට ලකුණු 01 බැගින්)<br>**( i සිට iv දක්වා උපරිම ලකුණු 10 )** | **10** | |
| | **IV. භාෂා ප්‍රවීණතාවය හා අනෙකුත් අංශ පිළිබඳ ලබා ඇති සුදුසුකම්**<br>(i) සේවයට බඳවා ගැනීමේ භාෂාවට අමතරව ලබා ඇති වෙනත් භාෂා ප්‍රවීණතා පිළිබඳව දැනුම සඳහා රජයේ පිළිගත් ආයතනයකින් සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඊට සමාන පාඨමාලාවක් හදාරා තිබීම (සහතික පත් මගින් සනාථ කළ යුතුය) - 05<br>(ii) රජයේ පිළිගත් පරිගණක, කළමනාකරණ හෝ ක්ෂේත්‍රයට අදාලව සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම (සහතික පත් මගින් සනාථ කළ යුතුය) - 05<br>( එක් පාඨමාලාවකට ලකුණු 1 බැගින් ) | **10** | |
| | **V. රැකියා ක්ෂේත්‍රයට අදාල දේශීය/විදේශීය පුහුණු**<br>මාස 03 හෝ මාස 03 කට නොඅඩු - 05<br>මාස 02 හෝ මාස 02 කට නොඅඩු - 04<br>මාස 01 හෝ මාස 01කට නොඅඩු - 03 | **5** | |
| | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය** | **5** | |

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

# අයදුම්පත්‍රය

**උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම - 2025**

**01. 1.1** මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්):- ..............................................................

**1.2** සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :- ..............................................................
..............................................................

**1.3** සම්පූර්ණ නම සිංහලෙන් :- ..............................................................
..............................................................

**1.4** ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**1.5** උපන් දිනය :- වර්ෂය .................... මාසය..................... දිනය .......................

**1.6** 2026.01.09 දිනට වයස : අවුරුදු .................. මාස .................... දින ..............

**1.7** ස්ත්‍රී/පුරුෂ භාවය :- ..............................................................

**02. 2.1** ස්ථිර ලිපිනය :- ..............................................................
..............................................................

**2.2** රාජකාරී ලිපිනය :- ..............................................................
..............................................................

**2.3** දුරකථන අංකය (රාජකාරී) :- ..............................................................

**2.4** දුරකථන අංකය (පෞද්ගලික) :- ..............................................................

**2.5** විද්‍යුත් ලිපිනය (පෞද්ගලික) :- ..............................................................

**03. 3.1** මුල් පත්වීමේ දිනය :- ..............................................................

**3.2** සේවය ස්ථිර කළ දිනය :- ..............................................................

**3.3** 1 ශ්‍රේණියට උසස් කළ දිනය (ලිපියේ පිටපතක් අමුණන්න) :- ..................................

**3.4** දැනට දරණ තනතුර හා ඊට පත්වූ දිනය :- ..............................................................

**3.5** 2026.01.09 දිනට සේවා කාලය :- අවුරුදු................. මාස................ දින ...........

**04.** අධ්‍යාපන සුදුසුකම් :-

| අනු අංකය | ලබා ඇති උපාධි/ පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | විෂය ක්ෂේත්‍රය | ප්‍රතිඵල වලංගු දිනය | විශ්ව විද්‍යාලය/ ආයතනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

**05.** **වෘත්තීය සුදුසුකම් :-**

| අනු අංකය | වෘත්තීය සුදුසුකම් | වලංගු දිනය | ආයතනය |
|---|---|---|---|
| | | | |
| | | | |

06. අයදුම්කරුගේ ප්‍රකාශය :-

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා මෙම තනතුරට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් එම පත්වීම අවලංගු කිරීමට යටත් වන බවත් මා දනිමි.

දිනය :- ............................................ ..................................................

අයදුම්කරුගේ අත්සන.

07. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ..................................................................................................... මහතා / මහත්මිය / මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ...................................... වශයෙන් සේවය කරනු ලබයි. පූර්වාසන්න වසර 05 තුළ ඔහු / ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරිය හැකි /නොහැකි බවත් සහතික කරමි.

දිනය :- ........................................... .......................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව මගින් සනාථ කළ යුතුය.)